ලංකා සතොස ලිමිටඩ් - 2014

---------------------------------------------

ලංකා සතොස ලිමිටඩ්හි 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සිදු කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියුතු වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

----------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (“අධ්‍යක්ෂ මණ්ඩලය”) වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවත් මතය ව්‍යාචනය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

## 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

---------------------------------------

### (අ) දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණවලට අදාල සම්පූර්ණ ලේඛනයක් නොමැති වීම නිසා දේපල, පිරියත හා උපකරණවල සම්පූර්ණත්වය, පැවැත්ම සහ නිරවද්‍යතාවය සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත් විය නොහැකි විය. එහි ඇතැම් ආරම්භක ශේෂවල හඳුනාගත නොහැකි සහ සැසඳීම් නොකළ වත්කම් වටිනාකම් ඇතුළත් විය.

### (ආ) කෙරීගෙන යන වැඩ සහ ව්‍යාපෘති අත්තිකාරම්

#### (i) කිලිනොච්චි මෙගා ව්‍යාපෘතිය - රු. 255, 223, 652

ව්‍යාපෘතිය යටතේ කිලිනොච්චි සතොස සුපිරි වෙළඳ සංකීර්ණය ශ්‍රී ලංකා රජයට අයත්වූ ඉඩමක ඉදිකර තිබුණි. මෙම ඉඩමේ අයිතිය, විගණන වාර්තාවේ දිනය වනවිටත් ලංකා සතොස ලිමිටඩ් වෙත පවරා ගෙන නොතිබුණි. තවද, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාර්යයන් ප්‍රසම්පාදන පටිපාටියෙන් බැහැරව සමුපකාර තොග වෙළඳ සංස්ථාව වෙත පවරා තිබුණි.

#### (ii) වැලිසර ව්‍යාපෘතිය - රු. 97,222,803

ඉඩමේ අයිතිය සනාථ කර ගැනීම සඳහා ඉඩමේ ඔප්පුව ඉදිරිපත් කර නොතිබුණි. ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව ඉදිකිරීම් කාර්යයන් සමුපකාර තොග වෙළඳ සංස්ථාව වෙත පවරා තිබුණි.

**(ඇ) භාණ්ඩ තොග**

පරිගණක පද්ධතියෙන් බැහැරව ක්‍රියාත්මක වන සමාගමේ අලෙවිසැල් සඳහා බින් කාඩ් ක්‍රමය හෝ වෙනත් විකල්ප ක්‍රමයක් හෝ ක්‍රියාත්මක නොවීම නිසා 2014 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල 2014 දෙසැම්බර් 31 දිනට පවතින තොගයේ ප්‍රමාණය සම්බන්ධයෙන් සෑහීමට පත් විය නොහැකි විය.

**(ඈ) වෙළඳ සහ වෙනත් ලැබිය යුතු ශේෂ**

**(i) ණය මැම පාලනය**

අදාල උපලේඛන සමඟ වයස් විශ්ලේෂණ සහ ශේෂ පත්‍ර දිනට පසුව සිදුවීම් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු. 193,048,673 ක් වූ ණය මැම ශේෂයෙහි නිරවද්‍යතාව, පැවැත්ම හා සම්පූර්ණත්වය සම්බන්ධයෙන් සෑහීමට පත්විය නොහැකි විය.

**(ii) ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂය - රු. 36,453,533**

මෙම ලැබිය යුතු ශේෂය සඳහා සනාථ කිරීම් ඉදිරිපත් නොවීය. ශේෂ පත්‍ර දිනට පසුව සිදුවීම් හෝ සනාථ කිරීම් නොතිබීම හේතුවෙන් මෙම ශේෂය අය කර ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් සෑහීමට පත්විය නොහැකි විය. තවද අයකර ගැනීම අවිනිශ්චිත මෙම ශේෂ සම්බන්ධයෙන් සමාගම බොල්ණය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**(iii) කුලී අත්තිකාරම්**

සම්පූර්ණ කරන ලද උපලේඛන හා සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු.139,119,000 ක් වූ කුලී අත්තිකාරම් ශේෂයේ නිරවද්‍යතාව, සම්පූර්ණත්වය සහ පැවැත්ම සම්බන්ධයෙන් සෑහීමට පත් විය නොහැකි විය.

**(ඉ) වෙළඳ ණයහිමියන් සහ වෙනත් ගෙවිය යුතු ශේෂ**

වෙළඳ ණයහිමියන් සහ වෙනත් ගෙවිය යුතු ශේෂයේ නිරවද්‍යතාව, සම්පූර්ණත්වය සහ පැවැත්ම තහවුරු කරගැනීම සඳහා පහත තත්ත්වයන් හේතුවෙන් ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය.

**(i) වෙළඳ සහ වෙනත් ණයහිමියන්**

එකතුව රු. 2,367,614,606 ක් වූ වෙළඳ ණයහිමියන් සහ වෙනත් ණයහිමි ශේෂයට අදාලව උපලේඛන, වයස් විශ්ලේෂණ, හා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එහි නිරවද්‍යතාව, සම්පූර්ණත්වය සහ පැවැත්ම සම්බන්ධයෙන් සෑහීමට පත්විය නොහැකි විය.

**(ii) හඳුනා නොගත් ණයහිමි ශේෂය - රු. 14,368,296**

ඉහත සඳහන් හඳුනා නොගත් ණය ශේෂය සත්‍යාක්ෂණය කිරීම සඳහා අදාල විස්තර ලැබී නොතිබුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**
------------------

**2.1 මතය ව්‍යාවනය**
-------------------

මෙම වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2** **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ නියමය පරිදි මම පහත සඳහන් කරුණු ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) ඉහත සඳහන් පරිදි විගණනය සඳහා අවශ්‍යවන්නා වූ සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා හට ලබා ගැනීමට නොහැකිවීම හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.3** **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 395 (ඇ) පරිදි මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ ඊළඟ මාසයේ 15 වන දිනට පෙර පිළියෙල කළයුතු වුවත් ගිණුම් 05 කට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පිළියෙල කර නොතිබුණි.

**2.4** **පැහැදිලි නොකළ වෙනස්කම්**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බැංකු ගිණුම් දෙකක ශේෂ හා ඒවාට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශවල සඳහන් ශේෂ අතර එකතුව රු.152,451 ක් වූ වෙනසක් පැවතුණි. මීට අමතරව සමාගම විසින් අලවිසැල්වල විකුණුම් මුදල් තැන්පත් කිරීමේ අරමුණින් පවත්වාගෙන යනු ලබන ඉතිරිකිරීමේ ගිණුමට අදාල අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ලෙස පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශනයේ සහ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ශේෂය අතර රු. 5,319 ක වෙනසක් පැවතුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,722,947,369 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,156,456,272 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,879,403,641 ක හෙවත් සියයට 248.9 ක පසුබැමක් විය. රජයේ ප්‍රතිපත්තිමය තීරණවලට අනුව ආනයනික සහල් සහන මිලට අලෙවිකිරීමත් සමාලෝචිත වර්ෂයට සාපේක්ෂව පරිපාලන වියදම් සියයට 35.6 කින් හා බෙදාහැරීමේ වියදම් සියයට 28 කින් වැඩිවීමත් ඉහත පසුබැමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2010 වර්ෂයේ රු.37,867,416 ක් ව පැවති සමාගමේ ශුද්ධ ලාභය 2013 වර්ෂය දක්වා උච්ඡාවචනයන් සහිතව 2014 වර්ෂයේදී රු. 1,722,947,369 ක අලාභයක් බවට පත් වී තිබුණි. එහෙත් මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය, රජයට ගෙවූ බදු සහ ක්ෂය වීම් නැවත ගැලපීමේදී 2010 වර්ෂයේ දී රු.727,700,314 ක් වූ ධන දායකත්වය අඛණ්ඩව වැඩිවී 2013 වර්ෂයේ දී රු. 2,416,461,468 ක් වුවද 2014 වර්ෂයේ දී රු. 172,791,952 ක ඍණ දායකත්වයක් වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවලට අනුකූලව සමාගමේ ලාභදායිත්ව අනුපාත සැලකිල්ලට ගත් විට 2013 වර්ෂයේ සියයට 13.59 ක් ව පැවති දළ ලාභ අනුපාතය 2014 වර්ෂයේ සියයට 4.28 දක්වා අඩු වී තිබුණු අතර 2013 වර්ෂයේ සියයට 4.61 ක් වූ ශුද්ධ ලාභ අනුපාතය 2014 වර්ෂය වනවිට සියයට 5.75 ක සෘණ අගයක් බවට පත්වී තිබුණි. ද්‍රවශීලතා අනුපාත සැලකිල්ලට ගත් විට 2013 වර්ෂයේ දී ජංගම අනුපාතය 1.36 ක අගයක්ව පැවතියද 2014 වර්ෂය වනවිට 0.95 ක පහල අගයක් බවට පත්ව තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------

## 4.1 කාර්යසාධනය

---------------------------

සාංගමික ව්‍යවස්ථාවලිය අනුව සමාගමේ අරමුණු පහත පරිදි වේ.

- සෑම ආකාරයකම අත්‍යාවශ්‍ය භාණ්ඩ සහ අනෙකුත් පාරිභෝගික භාණ්ඩ අලෙවිය, අලෙවිය සඳහා ඉදිරිපත් කිරීම සහ බෙදා හැරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
- දැරිය හැකි මුදලකට පාරිභෝගික ජනතාව වෙත සමාගමේ සිල්ලර අලෙවිසැල් හරහා අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ මිලදී ගැනීමට ඇති බව සහතික වීම.
- පාරිභෝගික සහ වෙනත් ආකාරයේ භාණ්ඩ තොග සහ සිල්ලර නියෝජිතයන් සහ වෙළෙන්දන් වශයෙන් ආනයන සහ අපනයන ව්‍යාපාරය ආරම්භ කර ස්ථාපනය කර කළමණාකරණය කිරීම. එම භාණ්ඩ ආනයනය කිරීමේ ව්‍යාපාරය ඒ අදාළ අවශ්‍ය අවස්ථාවේදී සතොස (Cooperative Wholesale Establishment) හි අලෙවිය සඳහා නොමැති භාණ්ඩ සම්බන්ධයෙන් පමණක් සීමා විය යුතුය.
- කෘෂිකාර්මික නිෂ්පාදන, පාරිභෝගික සහ අනෙකුත් ආකාරයේ භාණ්ඩ මිලදී ගැනීම, එකතු කිරීම, ක්‍රියාවලියට භාජනය කිරීම, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම, බෙදා හැරීම, අලෙවි කිරීම හා සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම. ඒ අදාළ අවශ්‍ය අවස්ථාවේදී සතොස (Cooperative Wholesale Establishment) හි අලෙවිය සඳහා නොමැති භාණ්ඩ සම්බන්ධයෙන් පමණක් සීමා විය යුතුය.
- එකවර මිලදී ගැනීම, බද්දට හෝ කුළියට ගැනීම යනාදි ක්‍රමයන්ගෙන් ගබඩා සහ අලෙවි පහසුකම් ස්ථාපනය කිරීම සහ වෙළඳ බඩු ගබඩා අලෙවි සහ ගබඩා ඉඩකඩ සහ පහසුකම් විකිණීම , බද්දට දීම, කුළියට දීම යනාදි ක්‍රමයන්ගෙන් ලබා ගැනීම.
- ගිවිසුම් මඟින් පුහුණු සහ නුපුහුණු කම්කරුවන් සහ වෙනත් මානව සම්පත්, ව්‍යාපාරය වෙත සහ වෙනත් පුද්ගලික ව්‍යවසායන් වෙත සැපයීම.
- පාරිභෝගික ජනතාව වෙත ඕනෑම ආකාරයක සේවාවක් සැපයීම.
- අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සිල්ලර අලෙවිය සිදුකිරීම මඟින් හැරෙන්නට මෙමඟින් අවසර ලබාදෙන ලද ව්‍යාපාරික කටයුතුවලට සහභාගි වීම මඟින් ස්වශක්‍යතාව ව්‍යාපාරයේ වාණිජමය පැවැත්ම තහවුරු කිරීම, මෙම ව්‍යාපාරය සමාගම විසින් පාරිභෝගික මහජනතාව වෙත සේවයක් සැලසීම මඟින් සිදුකළ හැකිය.

සමාගමේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාගමේ අරමුණු අතුරින් ගිවිසුම් මඟින් පුහුණු, නුපුහුණු කම්කරුවන් හා වෙනත් මානව සම්පත්, ව්‍යාපාරය හා වෙනත් පුද්ගලික ව්‍යවසායන් වෙත සැපයීම යන අරමුණ ඉටු කර ගැනීම කෙරෙහි කළමනාකරණය විසින් අවධානය යොමු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------------

ආනයනික සහල් නිෂ්කාශන කටයුතු සඳහා සමාගම විසින් නිෂ්කාශන ආයතනයකට, සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු. 123,856,064 ක අත්තිකාරම් මුදලින් රු. 57,708,419 ක් පියවීමට මාස 3 සිට මාස 6 අතර කාලයක්ද රු. 35,147,645 ක් පියවීමට මාස 8 සිට මාස 13 අතර කාලයක් ද ගතවී තිබුණු අතර ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් පියවා ගැනීම සඳහා කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------------

සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය 3075 ක් වුවත් 2014 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 3248 ක් වූ අතර ඒ සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 පරිච්ඡේදය ප්‍රකාරව අනුමත කාර්ය මණ්ඩලයට අනුරූපව ආයතනයේ සංවිධාන ව්‍යුහය පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි. එසේම උක්ත චක්‍රලේඛයේ 9.3 පරිච්ඡේදය අනුව, සමාගම විසින් බඳවා ගැනීමේ පරිපාටියක් අනුමත කරවා ගෙන නොතිබුණි. එබැවින් අවිධිමත් ලෙස කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සිදු කර තිබු අතර සමාගමේ අලෙවිසැල් සඳහා ප්‍රාථමික මට්ටමට අදාලව 323 ක කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන තිබුණි.

(ආ) ආයතනයේ ඉහළ කළමනාකරණයට අයත් ප්‍රධාන විධායක නිලධාරි සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි තනතුරු සඳහා සමාගම ආරම්භයේ සිටම කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සිදුකර තිබූ අතර ඒ හේතුවෙන් ඉහළ කළමනාකරණ මට්ටමට අදාලව ඉහළ සේවක පිරිවැටුමක් පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------------

## 5.1 ආයතනය පිහිටුවීම

-------------------------

මෙම සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 2005 ඔක්තෝබර් 26 දින සංස්ථාපනය කර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2010 මාර්තු 19 දින නැවත ලියාපදිංචි කර තිබුණි.

## 5.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ වර්ෂ 2 මාස 4 ක ප්‍රමාදයකින් පසුව එනම් 2017 ජුලි 12 දින වන අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

## 5.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) සහල් ආනයනය කිරීම**

සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1,914 ක් වැය කර සහල් මෙට්‍රික්ටොන් 30,302 ක් ආනයනය කර තිබු අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සහල් තොගය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව සභාපතිවරයාගේ උපදෙස් මත ආනයනය කර තිබුණි.

(ii) 2014 වර්ෂයේ සහල් ආනයන ක්‍රියාවලිය සිදු කරමින් පැවතියදී ඒ සම්බන්ධ අවධානයකින් තොරව සමාගම විසින් රු.මිලියන 1,199 ක් වටිනා ආනයනික සහල් මෙට්‍රික්ටොන් 18,134 ක් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව තෝරාගත්, දේශීය සැපයුම්කරුවන්ගෙන් විවිධ මිල ගණන් යටතේ මිලදී ගෙන තිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) මාර්ගෝපදේශය අනුව රු.500,000 ඉක්මවන ප්‍රසම්පාදන සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමකට එළඹිය යුතු වුවත්, යථෝක්ත සහල් මිලදී ගැනීමේදී සමාගම විසින් සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

**(ආ) ගොඩනැගිලි කුලී**

සමාගම විසින් එහි අලෙවි කටයුතු පවත්වාගෙන යාම සඳහා 2014 දෙසැම්බර් 31 දින වන විට කුලී පදනම මත ලබාගෙන තිබූ ගොඩනැගිලි සංඛ්‍යාව 314 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව එදිනට කුලී වියදම රු.317,469,400 ක් විය. මේ සම්බන්ධව කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) මෙම ගොඩනැගිලි සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි.

(ii) අලෙවිසැල් ස්ථාපිත කරනු ලබන ගොඩනැගිලිවල තිබිය යුතු ප්‍රමිතිය සම්බන්ධයෙන් සමාගම විසින් පිරිවිතර පිළියෙල කර නොතිබුණි.

(iii) අදාල බදු ගිවිසුම්වල කොන්දේසිවලට අනුව ගොඩනැගිලි බදු දීමනාකරුගේ හිමිකාරීත්වය සනාථ කෙරෙන ලියවිලි බදු ගැනුම්කරු විසින් ලබා ගත යුතු වුවද අලෙවිසැල් බහුතරයක් සම්බන්ධයෙන් බදු දීමනාකරුගේ හිමිකාරීත්වය තහවුරු කෙරෙන ලියවිලි ආයතනය විසින් ලබාගෙන නොතිබුණි.

(iv) ගිවිසුම් කාලය අවසන් වීමෙන් පසුවද අලෙවිසැල් පවත්වාගෙන යාම සඳහා පවතින ගොඩනැගිල්ලම භාවිතයට ගන්නේ නම් පවතින ගිවිසුම අවසන් වීමට මාස 3 කට පෙර ගිවිසුම් අළුත් කර ගත යුතු බව ගිවිසුම් වල සඳහන් වුවද බහුතර අලෙවිසැල් සඳහා ගිවිසුම් කාලය ඉක්මවා යෑමෙන් අනතුරුව නව ගිවිසුම් ඇති කරගෙන තිබුණි.

(v) ගිවිසුම්ගත වීමෙන් තොරව රජයේ විවිධ ආයතන සතු ගොඩනැගිලි 18 ක අලෙවිසැල් පවත්වාගෙන යනු ලබන අතර එම ආයතන වෙත 2014 වර්ෂයට අදාලව ගෙවූ කුලී සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඊට අමතරව පෞද්ගලික අංශයෙන් ලබාගත් ගොඩනැගිලි දෙකක් වෙනුවෙන් ගිවිසුම් ගත වීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ දී රු. 795,000 ක් කුලී වශයෙන් ගෙවා තිබුණි.

(vi) මුදල් රෙගුලාසි 835(2) (ඉ) අනුව ගොඩනැගිලි සඳහා ගිවිසුම්වලට එළඹීමේ කාලසීමාව අවුරුදු 03කට වැඩි නොවිය යුතු වුවත් ආයතනය විසින් අවුරුදු 5 සිට අවුරුදු 10 දක්වා කාලසීමාවන් සඳහා ගිවිසුම්වලට එළඹ තිබුණි.

(vii) සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.6,892,300 ක් කුලී ගෙවා තිබූ අලෙවිසැල් 10 ක් වෙනුවෙන් ඇති කර ගන්නා ලද ගිවිසුම් අස්ථානගත වී තිබූ බැවින් කුලී ගෙවීම්වල නිවැරදිතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(viii) ගොඩනැගිල්ලේ හිමිකාරිත්වය තහවුරු කර ගැනීමකින් තොරව සහ විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව රත්මලාන - 02 අලෙවිසැල පවත්වාගෙන යාම සඳහා කුලියට ලබාගෙන තිබූ ගොඩනැගිල්ලක් වෙනුවෙන් ප්‍රධාන ඉංජිනේරුවරයා විසින් නිර්දේශ කර සභාපතිවරයා විසින් අනුමත කර තිබූ ගොඩනැගිල්ලෙහි විස්තර ඇතුලත් පත්‍රිකාව අනුව රු. 48,000 ක් වූ බදු කුලිය වෙනුවට අනුමැතියකින් තොරව මාසිකව රු. 53,000 බැගින් එකතුව රු. 636,000 ක් සමාලෝචිත වර්ෂයේදී කුලී වශයෙන් බාහිර පාර්ශවයකට ගෙවා තිබුණි. ඒ අනුව රු.60,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**(ඇ) කුලී වාහන සඳහා ගෙවීම් කිරීම**

ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව තෝරා ගෙන තිබූ කුලී වාහන සැපයුම් ආයතනයකින් ප්‍රවාහන සේවාවන් ලබා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 18,081,747 ක් ගෙවා තිබුණි.

**5.4 ප්‍රසම්පාදන සැලැස්ම**

---------------------------

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

----------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දූර්වලතා වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ප්‍රසම්පාදන කටයුතුවලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුගමනය කර නොතිබීම. |
| (ආ) මූල්‍ය පාලනය | බැංකු සැසඳුම් ප්‍රකාශ නිවැරදිව හා නියමිත දිනට පිළියෙල නොකිරීම. |
| (ඇ) මානව සම්පත් පාලනය | අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් නොතිබීම සහ අවිධිමත් ලෙස බඳවා ගැනීම් හා උසස් කිරීම් සිදු කිරීම. |
| (ඈ) තොග පාලනය | තොග වාර්තා නිවැරදිව පවත්වා නොගැනීම |
| (ඉ) වත්කම් පාලනය | ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තා නිවැරදිව පවත්වා නොගැනීම. |
| (ඊ) කොන්ත්‍රාත් පාලනය | අයිතිය පවරා නොගත් ඉඩම්වල ඉදිකිරීම් සිදු කිරීම. |